STREAM

ප්‍රතිපත්ති

සාරාංශය

මාර්තු -- 2005

සාරාංශගතය ...

ජීවනෝපාය සඳහා ප්‍රවේශය

... පිටු 02 ක් ඇතුළත්ය

www.streaminitiative.org

අංක 2.

සාරාංශය

**මෙය කුමක් ගැනද?**

මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ග, අධ්‍යයනය සහ ජීවන අභිමතාර්ථ සපුරා ගැනීමට උදවු වීම

**මෙය කියවිය යුත්තෙ...**

.. මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ග ඔවුන් සතු සම්පත් අවධානම් තත්ත්ව සහ ඔවුන්ගේ ජීවන අභිමතාර්ථ වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමටය.

: මෙහි අඩංගු වනුයේ

- දිළිඳු භාවය පිටු දැකීමේදී ජාතික ජලජ සම්පත් කළමනාකරණය සිදු කළ යුත්තේ කෙසේද යන්න.
- ජීවනෝපාය මාර්ග විශ්ලේෂණය සිදු කිරීමේදී මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් මනාව අවබෝධ කර ගන්නේ කෙසේද යන්න.
- මිනිසුන් ට ඇති සම්පත් මොනවාද, මිනිසුන්ගේ කැමැත්ත කුමක් සඳහාද, පවතින සම්පත් ඵලදායි ලෙස යොදා ගන්නේ කෙසේද යන්න
- ජාතික සංවර්ධන වැඩපිළිවෙලවල් දුප්පත් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් වර්ධනය කිරීම උදෙසා යොදා ගන්නේ කෙසේද යන්න.
- දුප්පත්කම සහ ප්‍රතිපත්ති අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව

ජීවනෝපාය මාර්ග විශ්ලේෂණය මිනිසුන්ගේ සහභාගිත්වය මත ක්‍රියාත්මක වන දෙයක් වන අතර, එමගින් මිනිසුන් පිළිබඳ රජයට පවතින අවබෝධය වැඩි වේ.

ජීවනෝපාය මාර්ග විශ්ලේෂණයේදී ප්‍රධාන වනුයේ සම්පත් භාවිතා කරන මිනිසුන් මිස සම්පත් කළමනාකරණ ක්‍රමය නොවේ.

**මෙම සාරාංශගතය සමග ඔබට හැකිනම් පහත සඳහන් දේ කථා කරන්න.**

ධීවර අමාත්‍යාංශය සහ අදාල අනෙකුත් ආයතන වල සිටින නිලධාරින්ගේ හැකියාවන් දියුණු කර, එමගින් මිනිසුන් ගේ ජීවන තත්ත්ව සහ අභිමතාර්ථ සාර්ථක කර ගැනීමට පහසුකම් සළසා දිය යුතුය. මෙයට ජීවන තත්ත්ව අධ්‍යනයන් සහ ජලජීවි සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණුකිරීම් ඇතුළත්ය.

**සාරාංශගතය ...**

මිනිසුන්ගේ ජීවන අභිමතාර්ථ සපුරාලන ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදි බොහෝ විට ගැටළු සහගත තත්ව පැන නගී. නමුත්, මෙහිදි වැදගත් විය යුතු ප්‍රදේශ 03 වනුයේ, මිනිසුන්ගේ ජීවන තත්ත්ව අධ්‍යයනය අවබෝධ කර ගැනීමට ඇති හැකියාව, අනෙකුත් ජාතික අවශ්‍යතා පිළිබඳ සළකා බැලීම සහ ජාතික වැඩපිළිවෙලක් සඳහා අනෙකුත් රාජ්‍යයන් වෙතින් කෙරෙන බලපෑම් ය.

- දකුණු ආසියාවේ ජලජීවි සම්පත් කළමනාකරණයට යොමු වූ රාජ්‍යයන් ප්‍රධාන වශයෙන් තාක්ෂණය සහ නව සොයා ගැනීම් වෙත අවධානය යොමු කරයි. නමුත්, දුප්පත්කම දුරලීම, ජාතික ජලජීවි සම්පත් පරිපාලනයේ ප්‍රධාන අභිමතාර්ථයක් විය යුතු නිසා මිනිසුන් ගන්නා තීරණ, ඔවුන් ට ඇති සම්පත් සහ ඒවා මනා ලෙස උපයෝගි කර ගනිමින් ජීවනෝපායන් වැඩි දියුණු කර ගන්නා ආකාරය පිළිබඳ රජයන් දැනුවත් විය යුතුය.
- මෙය ළඟා කර ගැනීම සඳහා මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් අවබෝධ කර ගන්නා ක්‍රම සහ විධි පිළිබඳ වගකිවයුතු ආයතන දැනුවත් විය යුතුය. මෙහිදී මිනිසුන් ජීවත්වන පරිසරය, ඔවුන් සතු සම්පත්, අවධානම් තත්ත්ව, ජීවන අභිමතාර්ථ සහ ජීවනෝපාය මාර්ග පිළිබඳ දත්ත රැස්කර ගතයුතුය.
- මිනිසුන්ගේ ජීවනෝපායන් විශ්ලේෂණය කිරීමේදි මිනිසුන්ගේ කැමැත්ත සහ හැකියාව, ඔවුන් සතු සම්පත් සහ එම සම්පත් ජීවන අභිමතාර්ථ ළඟා කර ගැනීමට යොදාගත හැකි ආකාරය සැළකිය යුතුය. මෙහිදී මිනිසුන් කෙරේ වැඩි අවධානය යොමු විය යුතුය.

→ ඉහළ පෙලේ නිලධාරින් හට තාක්ෂණික දැනුම තිබුණ ද, ජීවනෝපාය ගැන විශ්ලේෂණය කිරීමේ ක්‍රමය වැනි සහභාගිත්වය මුල් වූ ක්‍රම පිළිබඳ වැඩිදුර පුහුණුවක් ලබා දීම සුදුසුය.

.

ජීවනෝපාය ක්‍රම වෙත යොමු වීම පිළිබඳ සාරාංශය

- ජීවනෝපායන් විශ්ලේෂණය කිරීමේ ක්‍රමය සංවිධානාත්මක නමුත්, වඩාත් නම්‍යශීලි වූ ක්‍රමයකි. මෙම විශ්ලේෂණ ක්‍රමය මිනිසුන්ගේ සහභාගිත්වය මත ක්‍රියාත්මක වන අතර, තනි පුද්ගලයින් සහ කණ්ඩායම් සතු අත්දැකීම් මත පදනම් වේ.

- ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ප්‍රාදේශීය සේවාවන් හඳුනාගැනීමේදී ජීවනෝපාය විශ්ලේෂණ ක්‍රමය වඩාත් වැදගත් වන බැවින්, ජාතික ප්‍රතිපත්ති සැදීමේදී පවා මෙය යොදාගත හැක. (පහත සඳහන් කොටුව බලන්න)

ජාතික ප්‍රශ්න සහ ජීවනෝපායන් විශ්ලේෂණ ක්‍රම :

1992 ක්‍රියාත්මක වූ Rio Earth Summit ප්‍රතිපත්ති මාලාව මගින් දීර්ග කාලීන පැවැත්මක් සඳහා රජයන් සතු විය යුතු සැළැස්ම (National Strategies for Sustainable Development - NSSD) පිළිබඳ අවධානය යොමු විය. එමගින් රාජ්‍යයන් ආර්ථික, පාරිසරික සහ සාමාජයීය ලෙස දියුණු විය යුතු බවට කරුණු සාකච්ජා වීම.

ලෝක බැංකුව මගින් වඩාත් සාර්ථක වූ සංවර්ධන ක්‍රියාවලියක් පිළිබඳ අවධානය යොමු වේ. (Comprehensive Development Frame works - CDFs)

ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දුප්පත්කම දුරලීම සඳහා Poverty Reduction Strategy Papers (PRSPs) ආධාර කර ගන්නා ලදි.

NSSDs, CDFs සහ PRSPs යන ව්‍යාපෘති වඩාත් හොඳින් ජීවනෝපායන් විශ්ලේෂණ ක්‍රම භාවිතා කරන ලදි.

දකුණු ආසියාව තුළ දුප්පත් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් අවබෝධ කර ගැනීමේදි මෙම ජීවනෝපාය විශ්ලේෂණ ක්‍රම මූලිකත්වය ගෙන ක්‍රියා කරයි.

- ජීවනෝපාය ක්‍රම විශ්ලේෂණය මගින් ලබාගත හැකි ප්‍රතිඵල වනුයේ
    - ගොවීන්ගේ සහ ධීවරයන්ගේ දුප්පත් කම සහ ප්‍රතිපත්ති වල ඇති සාර්තක භාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
    - දුප්පත් මිනිසුන්ගේ ජීවන අභිමතාර්ථ සපුරා ගැනීමේදි ජලජීවි සම්පත් කළමනාකරණයේ ඇති වැදගත්කම සොයා බැලීම

**අනෙත් වාර්තා සහ තොරතුරු සඳහා විස්තර ලබා ගැනීමට:**

- An 18 page guidance note on comparing development approaches from the UK Department for International Development http://www.livelihoods.org/info/guidance_sheets_pdfs/section6.pdf
- A 4-page Better-practice Guideline on Livelihoods Approaches – Capacity-building and Analysis http://www.streaminitiative.org/Library/bpg/index.html
- Livelihoods and Fisheries in the Lower Mekong Basin: Understanding the concept of livelihoods approaches. Mekong Development Series No. 5 http://www.streaminitiative.org/Library/pdf/pdf-india/FisheriesLivelihoodsStudy.pdf

මෙය පැමිණියේ කොහෙන් ද?
මෙම ප්‍රතිපත්ති සාරාංශගතය සාදනු ලැබුවේ NACA ආයතනය යටතේ ක්‍රියාත්මක වන STREAM ව්‍යාපෘතිය මගිනි. සාරාංශගතය 2 මගින් FAO ආයතනය මගින් ක්‍රියාත්මක වන Assistance in Poverty Alleviation through Improved Aquatic Resources Management in Asia - Pacific යන ව්‍යාපෘතිය පිළිබඳ ඇතුළත්ය.

වැඩිපුර විස්තර සඳහා,

www.streaminitiative.org/Library/India/india.html

STREAM, NACA, Suraswadi Bldg, DOF Complex, Kasetsart University, Ladyao, Jatujak, Bangkok 10900 THAILAND, Fax (662) 561-1727, Tel (662) 561-1728